# ජාඇල ප්‍රාදේශීය සභාව.
# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ජාඇල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.10,099,000 ක් ප්‍රාග්ධනිත කිරීමේදී රු.100,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරන ලද ගොඩනැගිලි හතක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේදී, එහි කළ වැඩ වටිනාකම නොසළකා ඇස්තමේන්තු වටිනාකම සලකා ප්‍රාග්ධනිත කිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.438,043 ක් වැඩියෙන් ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී 304-4 වැය ශීර්ෂය මගින් වියදම් දරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකිරීම නිසා ණයහිමි ශේෂය රු.735,461 ක් වැඩියෙන් ගිණමේ දක්වා තිබුණි.

(ඈ) 2012 ජුනි 08 දින පිඹුරු අංක 4611/L දරන බිම් කට්ටි සැලසුම අනුමත කිරීමේදී පොදු පහසුකම් සඳහා වෙන්කළ පර්චස් 29.38 ක බිම් කොටස විගණන දිනය වූ 2013 අගෝස්තු 27 දින වන විටත් ඔප්පුවක් මගින් පවරාගෙන නොතිබුණු අතර,

මෙම ඉඩම, මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු රු.1,097,056 ක ස්ථාවර තැන්පතු පොලිය ආදායමට ගෙන නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී ලද රු.50,000 ක උසාවි දඩ මුදල වර්ෂයේ ආදායමට නොගෙන තැන්පතු ලෙස ගිණුම්ගතකර තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.9,819,876 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 119,082,878 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 51,052,758 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

(අ) බැංකු සැසඳුම පිළියෙල කිරීමේදී මුදල් පොතේ ශේෂය හා සැසඳුමට ගෙන ඇති ශේෂවල වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) දෙසැම්බර් 31 දිනට අගරු චෙක්පත් ගිණුමේ රු.318,720 ක ශේෂයක් පැවති අතර, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 **අවිනිශ්චිත ගිණුම්**

වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන අවිනිශ්චිත ගිණුම්වල 2012 දෙසැම්බර් 31 දිනට බැර ශේෂ එකතුව රු.236,425 ක් විය.

2.4 **ආදායම් පරිපාලනය**

2.4.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තු ආදායම් හා තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | 000. රු. | 000. රු. | 000. රු. |
| (i) | වරිපනම් හා බදු | 32,758 | 33,677 | 33,757 |
| (ii) | බදු කුලී | 4,218 | 4,422 | 10,231 |
| (iii) | වෙනත් ආදායම් | 9,133 | 9,343 | 2,783 |

ඉහත කරුණු අනුව ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය 50% ක අගයක් ගැනුණි.

2.4.2 <u>වරිපනම් බදු</u>

(අ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.34,969,180 ක් වූ අතර, එහි රු.10,000 ට වැඩි හිඟ ශේෂවල එකතුව රු.2,756,045 ක් විය.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 80/46 දරන චක්‍රලේඛය ප්‍රකාර අවම වශයෙන් වසර 5 කට වරක්වත් කඩ කුලිය හා වරිපනම් බදු තක්සේරු කළයුතු වුවද, 2001 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි.

2.4.3 <u>බදුකුලී</u>

(අ) 2012 දෙසැම්බර් 31 දිනට රාගම උපකාර්යාලය සතු මස්කඩවලින් ලැබියයුතු ආදායම රු.3,460,942 ක් වූ අතර, එහි වසර 5 සිට වසර 15 දක්වා පැරණි ශේෂයන්ගේ එකතුව රු.2,662,500 ක් විය.

(ආ) සභාව සතු නොවන මස්කඩවලින් ලැබියයුතු ආදායම රු.1,533,273 ක් වූ අතර, වසර 5 සිට වසර 20 දක්වා කාලයක් ගතවී ඇති ශේෂයක්ද ඊට ඇතුළත්ව තිබූ නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත සම්පත්</u>

ප්‍රාදේශීය සභාව සතුව වාහන 34 ක ඇණියක් පැවති අතර, පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) හමුදා සේවයට දුන් ඩබල් කැබ්රථය 2009 පෙබරවාරි 27 සභාවට භාරදී තිබුණි. එන්ජිම දෝෂ සහිත බැවින් ගාල් කර වසර 3 ක් ඉක්මවා ඇතත් අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ආ) වාහන 2 ක් හා යන්ත්‍ර 3ක් දීර්ඝ කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පැවති අතර අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

වෑන් රථයක් 2011 දෙසැම්බර් 18 සිට 2012 ජනවාරි 31 දක්වා කාලය තුළ ගමන් කළ ස්ථාන, දුර, සැතපුම් ගණන, ගමන් කළ නිලධාරීන් හා වාහනය පාවිච්චි කළ නිලධාරියාගේ අත්සන ආදිය කිසිදු තොරතුරක් දෛනික ධාවන සටහන් පත්වල ඇතුළත් කර නොතිබූ නමුත් එම කාලය තුළ ඉන්ධන ලීටර් 637 ක් ලබාගත් බවට දෛනික ධාවන සටහන්වල සඳහන් කර තිබීම විගණනයට පිළිගත නොහැකි විය.

## 2.7 ආර්ථිකමය නොවූ ගනුදෙනු

(අ) ආරක්ෂක සේවා

ආයතනය තුළ ආරක්ෂක සේවා කාර්ය මණ්ඩලය 13 ක් සිටියදී ඊට පරිබාහිරව තවත් 10 දෙනෙකු ආරක්ෂක සේවාව සඳහා බාහිරව ලබාගෙන ඒ සඳහා රු.1,933,970 ක් ගෙවා තිබුණි.

(ආ) වාහන කුලියට ගැනීම

(i) සභාව සතුව ට්‍රැක්ටර් 18 ක් හා ලොරි රථ 2 ක් තිබියදීත් විදුලි අංශයේ නඩත්තු කටයුතු සහ කැලි කසල ඉවත් කිරීම සඳහා ට්‍රැක්ටර් එකක් සහ ලොරි රථයක් කුලියට ගෙන තිබූ අතර, ඒ සඳහා 2012 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.748,000 ක් හා රු.734,450 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) කුලී රථ ලබා ගැනීමේදී කුලී හිමියා සතුව නෛතික අයිතිය තිබීමත් රථය සඳහා සර්වග්‍රාහී රක්ෂණ හිමිකමක් ලබාගෙන තිබියයුතු වුවත් කුලියට ගෙන ඇති වාහන සම්බන්ධයෙන් එකී කරුණු සපුරා නොතිබුණි.

(iii) 2012/2013 වසර වලදී ට්‍රැක්ටර් 02 ක් සභාවට අළුතින් ගෙන තිබිය දීත් 2011 ඔක්තෝබර් 01 දින සිට වසරක කාලයකට කුලියට ගත් ට්‍රැක්ටර් රථය 2013 සැප්තැම්බර් 30 දින තෙක්ම කුලී සේවය ලබාගෙන තිබුණි.

(iv) සභාව සතු PC-60 එස්කැවේටරයේ ට්‍රැවල්ස් මෝටර් අක්‍රියවීම හේතුවෙන් සේවයේ යෙදවීමට නොහැකිවීම මත කුලී පදනම මත එක්ස්කැවේටරයක් ලබාගෙන ඒ සඳහා රු.619,750 ක් ගෙවා තිබුණි. PC-60 ට අදාළ ලිපිගොනුව හා දෛනික

ධාවන සටහන් පරීක්ෂාවේදී මෙම එක්ස්කැවේටරය අළුත්වැඩියා කිරීමට ඇති බවක් හෝ අළුත්වැඩියාවක් සිදුකර ඇති බවක් හෝ විගණනයට නිරීක්ෂණය නොවීය.

(v) සභාව සතුව එක්ස්කැවේටර් 3 ක් පවතින අතර, ඉන් 2 ක් අක්‍රිය තත්ත්වයේ පවතී. සභාව සතු මෙම රථ අළුත්වැඩියා කිරීමක් කර භාවිතයට ගැනීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කර බලා ඵලදායිව යොදා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.8 <u>ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි</u>

(i) බාහිර ආයතන 04 ක් විසින් එකතුව රු.3,495,169 ක වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව අධිකරණවල නඩු හතරක් ගොනුකර තිබුණි.

(ii) ආයතනය විසින් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් බාහිර ආයතනයකට එරෙහිව රුපියල් ලක්ෂ 43 ක වන්දි ඉල්ලා ජාතික බේරුම්කාර මණ්ඩලයේ නඩුවක් ගොනුකර තිබුණි. මේ සඳහා නියමිත වන්දි මුදල සභාවට ගෙවීමට තීන්දුව දී ඇතත්, අභියාචනා ගොනුකර තිබුණි.

## 2.9 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශය තුළ දිනකට ජනනය වන කසල ප්‍රමාණය ටොන් 42 පමණ වන අතර ඉන් දිනකට එකතු කරනු ලබන කසල ප්‍රමාණය ටොන් 26 ක් පමණ වේ.

මේ සම්බනධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තළ කසල එකතු කිරීමේදී ඒවා දිරන/ නොදිරන ලෙස තේරීමක් සිදුකර නොතිබුණි.

(ආ) කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා යොදාගනු ලබන දිරන කසල ප්‍රමාණය දිනකට ටොන් 05-10 ත් අතර වූ අතර, ඉතිරි කසල සියල්ලම (දිරන/නොදිරන) නැදුරුපිටිය පෞද්ගලික ඉඩමකට බැහැර කිරීම සිදුකර තිබුණ.

එහෙත් එමගින් අවට ජනතාවට මහත් අපහසුවක් සිදුවන බව නිරීක්ෂණය වු අතර, මේ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් වරින්වර පරීක්ෂාකර බලා වාර්තා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව,

- මෙම ස්ථානයේ අධික දුර්ගන්ධයක් පැවතීම
- බල්ලන්,ගවයන්,ඌරන් ආදී සතුන් ඒකරාශී වීම
- අනවසරයෙන් පටස්තර පුද්ගලයන් විසින් කසල බැහැර කිරීම
- සුළඟ නිසා කසල තැන තැන විසිර යාම (පොලිතින්, කඩදාසි වැනි)
- කසල ගිනි ගැනීමේ අවධානමක් ඇතිවීම

2.10 **කාර්ය සාධනය**

සිව් අවුරුදු සැලැස්ම අනුව 2012 වර්ෂය තුළදී ඇස්තමේන්තුගත මුදල රු. ලක්ෂ 280 ක්වූ ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ අතර, 2013 සැප්තැම්බර් වන විටත් එම ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය ලේඛනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) වාහන උපයෝජනය

(උ) කසළ අපහරණය